# අම්පාර, රජගල පුරාවිද්‍යා භූමියෙන් හමු වූ මැටි මූර්ති පිළිබඳ අධ්‍යනයක්

**කේ. හෙට්ටිආරච්චි[1], එච්.එම්.ඒ. කරුණාරත්න[2]***

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ. [2] රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතිය, රජගලතැන්න, අම්පාර.

*hha.karunarathna@gmail.com

ප්‍රමුඛ පද : මැටි මූර්ති, වාස්තු විද්‍යාව, කැටයම්, මානව රූප, ස්ත්‍රී රූප

## හැඳින්වීම

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජගලතැන්න ග්‍රාම නිලධාරී වසමට අයත් රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතිය ඓතිහාසික හා වාස්තුවිද්‍යාත්මක සාධක බාහුල්‍යයකින් යුතු ආරාමික භූමියකි. මුහුදු මට්ටමින් අඩි 1038ක් පමණ උසින් පිහිටි මෙම කඳු වැටිය අක්කර 1025ක් පමණ භූමි භාගයකින් යුක්ත වේ. දකුණේ සිට උතුරට විහිදී යන කඳු ගැට කිහිපයකින් සමන්විත රජගල පුරාවිද්‍යා ආරාමික භූමියේ පිහිටීම සැලකිල්ලට ගනිමින් උපයෝගීතාව අනුව බෞද්ධ ආරාමික ගොඩනැගිලි විසිරී පැවැති අයුරු හඳුනාගත හැක.

වංශකතා සාධක හා රජගල භූමියෙන් හමු වූ ශිලාලේඛන සාධකවලට අනුව මෙම ආරාමය (ක්‍රි.පූ. 119-ක්‍රි.ව. 109) රජ කළ ලජ්ජිතිස්ස රජු විසින් ගොඩනැගූ බව පරණවිතාන සනාථ කර තිබේ. මෙහි ඇති අනෙකුත් ශිලා ලේඛන හා භෞතික පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව අනුරාධපුර යුගයේ අවසන් සමය තෙක් ආරාමයක් වශයෙන් ක්‍රියාත්මක වී ඇත.

රජගල පුරාවිද්‍යා භූමියෙන් හමු වූ මැටි රූප පිළිබඳ අධ්‍යනයේදී පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ ආරාමික භූමියෙන් හමුවූ මැටි රූපවල කලාත්මක ස්වරූපය අනුව කුමන අවධියක ලක්ෂණ නිරූපණය කරන්නේ ද? යන්න පිළිබඳ විමසීමයි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ බවට පත් වූයේ හමු වූ මැටි මූර්ති වර්ගීකරණය කරමින් ඒවායේ කලාත්මක හා නිර්මාණාත්මක අගය විවරණය කිරීමයි. මෙහි උප අරමුණු කිහිපයක් ද හඳුනාගත හැකි ය. එනම් ද්‍රව්‍යවල උපයෝගීතාව හඳුනාගැනීම හා නිර්මාණ තාක්ෂණ හඳුනාගැනීම වේ.

## ක්‍රමවේදය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස 2012 වර්ෂයෙහි සිට කරනු ලබන ඒ ඒ කැනීම් භූමි

වලින් හමු වූ මැටි මූර්ති විශ්ලේශනාත්මක ව ඉදිරිපත් කිරීම.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම අධ්‍යයනයේ දී අනාවරණය කරගත් මැටි රූප ප්‍රධාන කොටස් තුනකට වර්ගකර අධ්‍යනය කළ හැකි ය. මානව රූප, සත්ත්ව රූප, සැරසිලි මෝස්තර ප්‍රධාන වන අතර මානව රූපී ප්‍රතිමා කොටස් කිහිපයකට බෙදිය හැකි වේ. එනම්, මානව රූපී පුරුෂ, මානව රූපී ස්ත්‍රී වේ. මානව රූපී පුරුෂවලින් ඇතැම් ඒවා දිව්‍ය රූප වන අතර ඇතැම් ඒවා නාට්‍ය ශිල්පීන්ට අයත් ය. මේවා ගණ රූප ලෙස හඳුනාගත හැකි වේ. දිව්‍ය රූප ලෙස සිතිය හැකි සම්පූර්ණ ප්‍රතිමා කිසිවක් හමු නොවුණි. සියල්ල කැඩී පවතී.හිස, කඳ, හෝ පාද කොටස් හමු වේ. මේවායේ කලාත්මක ගුණය ඉතා ඉහළ මට්ටමේ පවතී. ගණ රූප හතරක් (4) හමු වී ඇති අතර දෙකක් අර්ධ උන්නත ය.

නාට්‍ය රූපවලට අයත් මැටි මූර්ති දෙකක් හමු වී ඇත. ගඩොළු කැටවල ඉදිරි මුහුණතෙහි නිර්මාණය කොට ඇති නාට්‍ය ශිල්පී රූප අතරින් අංක 8 රූපය උසස් නිර්මාණ ගුණයකින් යුක්ත ය. උස සෙන්ටිමීටර් 8ක් පමණ වන වේග රිද්ම නර්තන ඉරියව්වකින් සමන්විත ය. සත්ත්ව රූප සිව්පා ගණයට අයත් ඇත් රූප පමණක් හමු වේ. පූර්ණ සිරුර හමුව ඇත. හිස හා බැඳි කොටස් තාත්වික ව නිරූපිත අතර අංක 13 ඇත් රුව හිස කොටස පමණක් වේ. මේවා අලංකාරව නිර්මාණය කර ඇති අයුරු දෘශ්‍යමාන වේ.

සැරසිලි මූර්ති අතර නෙළුම් මල් හා නෙළුම් පෙති මෝස්තර පමණක් යොදාගෙන තිබීම රජගල සැරසිලි මූර්ති අතර විශේෂත්වයකි.

රජගලින් හමු වූ මැටි මූර්තිවලින් වැඩි ප්‍රමාණයක් ඒක ගණව සකසා නියමිත උෂ්ණත්වයකට පුළුස්සා ගත් ඒවා වේ. සුළු කොටසත් කුහර භාවිත ව නිර්මාණය කොට ඇත. සියුම් කැටයම් කිරීමේ දක්ෂතාව හොඳින් පිළිබිඹු වන අවස්ථාවක් ලෙස රජගල මැටි මූර්ති හැඳින්විය හැකි ය.

### ආශ්‍රිත ග්‍රන්ථ

ගොඩකුඹුර, සී. (1982), මැටි රූප, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ

Deraniyagala. (1957) ferrolithi Culture: Journal of the Ceylon branch of the Royal Asiatic Sociaty (New Series) J R A S. (C f B) Ns. Vol.V. Colombo

Hocart, (1924): 28. Pottery: Ceylon Journal of Science section G C (cJs. G) Colombo.